ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/පීසීජ්/ඩීසීසී/06/26

2022 සැප්තැම්බර් මස 13 වන දින

**ලේකම්**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රිය ලේකම්තුමනි

**<u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු යාන්ත්‍රණය ක්‍රමවත්ව පවත්වාගෙන යාම</u>**

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම හා පසුවිපරම් කටයුතු සිදු කිරීම සඳහා දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයින් හා අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් ගරු ජනාධිපතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් පත් කොට ඇත.

02. තවද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු යාන්ත්‍රණය ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් පහත පරිදි නියෝග කර ඇත.

i. සෑම මසකට වරක් දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම. දිස්ත්‍රික් ලේකම්වරයා මෙම රැස්වීම්වල කැඳවුම්කරු ලෙස කටයුතු කළ යුතු අතර, ඊට අදාළ සියලු කටයුතු සම්බන්ධීකරණය කළ යුතු ය.

ii. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී පැන නගින ගැටලු පිළිබඳව අවම වශයෙන් තෙමසකට වරක් හෝ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට සුදුසු යාන්ත්‍රණයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

iii. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු නිසි පරිදි ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් වෙත අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ කාර්යාල පහසුකම් ලබාදීම.

iv. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් හෝ කළමනාකරණ සේවා නිලධාරීන් අතුරින් 04 දෙනෙකු, පෞද්ගලික සහකාරවරයෙකු (MN 1-2016 වැටුප් පරිමාණයේ) කාර්යාල සේවක සේවයේ නිලධාරියෙකු හා රියදුරෙකුගෙන් සමන්විත සහාය කාර්ය මණ්ඩලයක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රාජකාරි සඳහා අනුයුක්ත කිරීම.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

v. ඉහත iv හි සඳහන් පෞද්ගලික සහකාර හා රියදුරු යන තනතුරු සඳහා පමණක් සේවා අවශ්‍යතාවය අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ නිර්දේශය මත, ඔහුගේ / ඇයගේ ධූර කාලයට පමණක් වලංගු වන පරිදි, අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත සුදුසු පුද්ගලයින් පත් කිරීම.

vi. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් වෙත නිල වාහනයක් අනුයුක්ත කිරීම හා එම වාහනය සඳහා මසකට ලීටර් 300 ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබාදීම.

03. ඒ අනුව, ගරු ජනාධිපතිතුමා විසින් ලබා දී ඇති ඉහත නියෝග අනුව කටයුතු කිරීම සඳහා සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙසත්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් හා සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැය ශීර්ෂ යටතේ වෙන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ස්තූතියි

මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්
දුරකථන : +94 11 2354420 ෆැක්ස් : +94 11 2446657
විද්‍යුත් තැපැල : prsec@presidentsoffice.lk

පිටපත් :

1. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
5. විගණකාධිපති

**....................... දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු න්‍යාය පත්‍රය - 2022 සැප්තැම්බර්**
**ස්ථානය : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පෙ.ව.9.00**

| | | | |
|---|---|---|---|
| ➢ | පිළිගැනීම | පෙ.ව.9.00 - පෙ.ව.9.02 | දිස්ත්‍රික් ලේකම්/ දිසාපති |
| 01. | ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය | | |
| 1.2 | ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ වැඩසටහන | පෙ.ව.9.00 පෙ.ව.9.40 | |
| 1.1.1 | ආර්ථික සුරක්ෂිතතාව | | කෘෂිකර්ම, සෞඛ්‍ය සත්ව පාලන, ධීවර, සංචාරක කර්මාන්ත.... අදාළ ආයතන ප්‍රධානීන් |
| 1.1.2 | ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති | | |
| 1.1.3 | මධ්‍ය පරිමාණ කර්මාන්ත | | |
| 1.3 | වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන | | වාරිමාර්ග ආයතන ප්‍රධානීන් |
| 1.4 | ............. | | |
| 02 | දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය | පෙ.ව.9.40 සිට පෙ.ව.10.20 | |
| 2.1 | ............ දිස්ත්‍රික් උපාය මාර්ග සංවර්ධන ව්‍යාපෘති | | අධ්‍යක්ෂ උ.මා.සං.ව්‍යාපෘතිය |
| 2.2 | ............... නගර සංවර්ධන ව්‍යාපෘතිය | | නාගරික සංවර්ධන අධිකාරිය, ..... මහ නගර සභාව |
| 2.3 | ............. රෝහල් සංවර්ධන කටයුතු | | රෝහල් අධ්‍යක්ෂ/ සෞඛ්‍ය ප්‍රධානීන් |
| 2.4 | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය | | පළාත් අධ්‍යාපන ප්‍රධානීන් |
| 03 | දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සංවර්ධනයට අදාළව ආයතන මගින් යොමු කර ඇති යෝජනා | පෙ.ව.10.20 සිට පෙ.ව.10.50 | ආයතන ප්‍රධානීන් |
| 3.1 | හෙළ විරු ඩිජිටල් , කෘෂි නිෂ්පාදන අලෙවිකරණ මෘදුකාංග හඳුන්වාදීම | | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 3.2 | ........................ | | |
| 04. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා | පෙ.ව.10.50 සිට පෙ.ව.10.55 | ආයතන ප්‍රධානීන් |
| 05. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටලු | පෙ.ව.10.55 සිට පෙ.ව.11.00 | පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ ප්‍රාදේශීය ලේකම්වරු |
| 06. | දිස්ත්‍රික්ක කමිටුව ගත් තීරණ දැනුම්දීම. | පෙ.ව.11.20 සිට පෙ.ව.11.25 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති |

**ස්තුතිය/ නිමාව**

*සැ.යු. මෙය ආදර්ශ ආකෘතියකි